**විසල් දඹුල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය - අදියර 1 - 2015**

-----------------------------------------------------------------------

විසල් දඹුල්ල ජල සම්පාදන ව්‍යාපෘතියේ - අදියර 1 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ඉන්දියා අපනයන - ආනයන බැංකුව අතර 2012 ජනවාරි 17 දින එළඹි ණය ගිවිසුම යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

--------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. දඹුල්ල, ගලේවෙල, සීගිරිය, හබරණ, පළුගස්වැව, නාවුල, පලාගොල්ල හා කැකිරාව යන ප්‍රදේශවල ජීවත්වන 300,000 පමණ ජනතාවට ආරක්ෂිත පානීය ජල පහසුකම් ලබාදීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘති පිරිවැය ඇස්තමේන්තුව අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 9,593 කට සමාන එජඩො මිලියන 86.8 ක් වූ අතර ඉන් රු.මිලියන 6,675.9 කට සමාන එජඩො මිලියන 60.69 ක් සැපයීම සඳහා ඉන්දියා අපනයන - ආනයන බැංකුව එකඟ වී තිබුණි. රු.මිලියන 1,882.1 කට සමාන එජඩො මිලියන 17.11 ක් සැපයීමට ශ්‍රී ලංකාවේ මහජන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2012 මාර්තු 06 දින ආරම්භ කර තිබුණු අතර 2014 සැප්තැම්බර් 05 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘති කාලපරිච්ඡේදය 2017 මැයි 31 දක්වා 04 වාරයක් දීර්ඝ කර තිබුණි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක, සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4. විගණකගේ වගකීම**

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි· කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව,

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

**-----------------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**2.1 මතය**

**---------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගතවන ගැටළු සහ වලින් ඇතිවන බලපෑම් හැර, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පිරිවැය රු.මිලියන 62.2 කට ප්‍රසම්පාදනය කරන ලද මෝටර් වාහනයක් හා ඩබල් කැබ් රථ 4 ක් ජංගම නොවන වත්කම් යටතේ වෙනම දැක්වීම වෙනුවට අඛණ්ඩව කෙරී ගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කර තිබුණි. තවද එක්සත් ජනපද ඩොලර් 229,569 කට සමාන රු.මිලියන 24.96 ක පිරිවැයකට 2015 වර්ෂයේදී ඉදිකරන ලද කාර්යාල ගොඩනැගිල්ලද කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කර තිබුණි.

**2.2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 08 වගන්තිය අනුව, රු.මිලියන 5 කට වැඩි කොන්ත්‍රාත් භාරගන්නා කොන්ත්‍රාත්කරුවන් පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් යටතේ ලියාපදිංචි විය යුතුය. තවද කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමෙන් පසු දින 60 ක් ඇතුළත පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් වෙත කොන්ත්‍රාත් ගිවිසුම් ලියාපදිංචි කළ යුතුය. කෙසේ වුවද ව්‍යාපෘතියේ කාර්යයන්හි යෙදුණු කොන්ත්‍රාත්කරුවන් ඉහත සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල වී නොතිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළ හා 2015 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2015 දෙසැම්බර් 31 දක්වා | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ඉන්දියා අපනයන - ආනයන බැංකුව | 60.69 | 6,675.90 | 350.00 | 2.82 | 387.12 | 47.32 | 6,142.09 |
| ශ්‍රී ලංකාවේ මහජන බැංකුව | 17.11 | 1,882.10 | | 0.76 | 102.17 | 11.23 | 1,456.92 |
| ශ්‍රී ලං ර | 9.00 | 1,035.00 | 140.85 | 0.36 | 50.04 | 3.57 | 450.94 |
| එකතුව | 86.80 | 9,593.00 | 490.85 | 3.94 | 539.33 | 62.12 | 8,049.95 |

**3.2 භෞතික ප්‍රගතිය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තා අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමස්ථ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 77.30 ක් සහ සියයට 80.05 ක්ව පැවතුණි. 2015 දෙසැම්බර් 31 දිනට අදාල කාර්යයන් සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වී තිබුණද බෙදාහැරීමේ නල එලීමේ මන්දගාමී ප්‍රගතිය හේතුවෙන් එදිනට නිමකල වැඩ ප්‍රමාණය සියයට 32.50 ක් විය. තවද, 2015 දෙසැම්බර් 31 දිනට ජලාශ ඉදිකිරීම් සහ සම්ප්‍රේෂණ එලීමේ සහ බෙදාහැරීමේ ජලාශයන් එලීමේ භෞතික ප්‍රගතිය මැනීමකින් තොරව අන්තර් ගෙවීමක් සිදුකර තිබුණි.

(ආ) උතුරු මැද පළාතේ වකුගඩු රෝගයෙන් පෙළෙන ජනතාවට පිරිසිදු ආරක්ෂිත පානීය ජලය සැපයීම හදිසි අවශ්‍යතාවයක් ලෙස ඉලක්ක කරගෙන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. එසේ වුවද, විධිමත් සැලැස්මකින් යුතුව ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් ව්‍යාපෘතියේ කටයුතු ප්‍රමාද වී ක්‍රියාත්මක කර තිබූ අතර ව්‍යාපෘති කාලය හතර වතාවක් දීර්ඝ කරගෙන තිබුණි.

**3.3 මූල්‍ය පාලන ගැටලු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 ජූලි 26 දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව ව්‍යාපෘතියේ ගනුදෙනු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන ඒකකයේ විගණනයට භාජනය කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 626 අනුව, විදේශ අරමුදල් ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රකාශන ව්‍යාපෘතිය විසින් පිළිගත් ගිණුම්කරණ මූලධර්මයන්ට අනුව වෙනම ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යා යුතුය. එයට පටහැනිව ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් මෙම ව්‍යාපෘතියද ඇතුළුව වෙනත් ආධාර සපයන ව්‍යාපෘති 12 ක ගනුදෙනු වාර්තා කිරීම සඳහා එකම මුදල් පොතක් පවත්වාගෙන ගොස් තිබුණි.

**3.4 කොන්ත්‍රාත් පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නියමිත කාලයට වඩා වැඩ ආරම්භ කිරීමේ කටයුතු ප්‍රමාදවීම, ප්‍රමාණවත් මිනිසුන් යෙදවීම සහ භෞතික සම්පත්, උප කොන්ත්‍රාත්කරුවන් විසින් සිවිල් ඉදිකිරීම් වැඩ මාර්ගයේ අඩක් අත්හැර දැමීම, ආනයනික ද්‍රව්‍යයන් සහ වෙනත් ද්‍රව්‍ය නියමිත වේලාවට සැපයීමේ ප්‍රමාදයන් යනාදී කොන්ත්‍රාත්කරුවන්ගේ විවිධ දුර්වලතාවල ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. කෙසේ වුවද, ව්‍යාපෘති ගිවිසුමේ 8.7 උප ඡේදය ප්‍රකාරව ඇවර කිරීමේ වන්දි කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීම සඳහා ව්‍යාපෘතිය විසින් පියවර ගෙන නොතිබුණි.

(ආ) දඹුල්ල, කිතුල්හිටියාව, හබරණ සහ කැකිරාව යන කොන්ත්‍රාත් වැඩබිම්වල 2017 මාර්තු 06 වෙනි දින සිදුකරන ලද වාරක පරික්ෂාවේදී ජලාපවාහන නල, යකඩ බාර්, යන්ත්‍රවල ඇවුරුණු කොටස් වැනි දෑ අනාරක්ෂිතව දමා තිබුණි. ඊට අමතරව එක්සත් ජනපද ඩොලර් 4,237,968 ක් පිරිවැය වූ විවිධ උපකරණ එනම් වතුර බට, විදුලි ජනක යන්ත්‍ර, විදුලි අයිතම සහ ජලාපවාහන බට යනාදිය සිවිල් වැඩ සම්පූර්ණ කිරීමට නියමිත දින පිළිබඳව සැලකිල්ලට ගැනීමකින් තොරව ආනයනය කිරීම හේතුවෙන් කොන්ත්‍රාත් වැඩබිම්වල නිශ්කාර්යව පැවතුණි. එම නිසා සැපයුම් ගිවිසුම් අනුව වගකීම් කාලය ඉකුත් වී තිබුණි.

**3.5 මූල්‍ය පාලනය පිළිබඳ ගැටළු**

ඉන්දියානු අපනයන ආනයන බැංකුවෙන් සහ මහජන බැංකුවෙන් එකතුව රු.මිලියන 8,077.66 ක ණය මුදල් ලැබුණු අතර රු.මිලියන 1,243.96 ක් ණය ලෙසද, ප්‍රදාන රු.මිලියන 6,833.70 ක් අදාල නියෝජිතායතනවලින් ලැබුණු ලෙස මූල්‍ය ප්‍රකාශන තුල දක්වා තිබුණි. එසේ වුවත්, 2015 දෙසැම්බර් 31 දක්වාම අදාල පාර්ශව සමඟ උප ගිවිසුම්වලට ඇතුළත් වී නොතිබුණි.